


# පරමාර්ථ ප්‍රකාශනිය

සහ

# පරමාර්ථ ප්‍රකාශනී සන්නය

# පරමාර්ථ ප්‍රකාශනීය.

**නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 පරමත්ථඤ්ඤූ සම්බුද්ධං, සද්ධම්මං ගණමුත්තමං,
නත්වා වක්ඛං සමාසෙන, පරමත්ථ පකාසනිං.

2 චිත්තං චෙතසිකං රූපං නිබ්බානං චෙති පරමත්ථා චතුබ්බිධා. තත්ථ චිත්තං එකූන නවුතිවිධං හොති.

3 සෙය්‍යථිදං? සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරි කමෙකං, සසඞ්ඛාරිකමෙකං, සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරික මෙකං, සසංඛාරික මෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරික මෙකං, සසඞ්ඛාරික මෙකං, උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසඞ්ඛාරික මෙකං, සසඞ්ඛාරික මෙකංතිලොභමූල චිත්තං අට්ඨ විධම්පි හොති.

4 දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං සසඞ්ඛාරික මෙකංතිදොසමූල චිත්තං දුවිධම්පි හොති.

5 උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්ත මෙකං, උපෙක්ඛාසහගතං උද්ධච්ච සම්පයුත්ත මෙකංති මොහමූල චිත්තං දුවිධම්පිහොති.

6 ඉච්චෙවං අකුසල චිත්තං ද්වාදස විධම්පි හොති.

—0—

7 උපෙක්ඛා සහගතං චක්ඛු විඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝානවිඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, දුක්ඛසහගතං කාය විඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන චිත්තං, උපෙක්ඛා සහගතං සන්තීරණ චිත්තං චෙති අකුසල විපාක චිත්තං සත්ත විධම්පි හොති.

8 උපෙක්ඛා සහගතං කුසල විපාකං චක්ඛුවිඤ්ඤාණං, තථා සොතවිඤ්ඤාණං, ඝාන විඤ්ඤාණං, ජිව්හා විඤ්ඤාණං, සුඛ සහගතං කායවිඤ්ඤාණං, උපෙක්ඛා සහගතං සම්පටිච්ඡන චිත්තං,

සොමනස්ස සහගතං සන්තීරණ චිත්තං, උපෙක්ඛා සහගතං සන්තීරණ චිත්තං චෙති කුසල විපාකා හෙතුකචිත්තං අට්ඨ විධම්පි හොති.

9 උපෙක්ඛා සහගතං පඤ්චද්වාරාවජ්ජන චිත්තං, තථා මනොද්වාරාවජ්ජන චිත්තං සොමනස්ස සහගතං හසිතුප්පාදචිත්තං චෙති අහෙතුක කිරිය චිත්තං තිවිධම්පි හොති.

10 ඉච්චෙවං අහෙතුක චිත්තං අට්ඨාරස විධම්පි හොති.

—0—

11 පාපාහෙතුකමුත්තානි, සොභනානීති වුච්චරෙ;<br>එකූන සට්ඨි චිත්තානි, අථෙක නවුතීපිවා.

12 සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකංති කාමාවචර කුසල චිත්තං අට්ඨවිධම්පි හොති.

13 සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං,සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකංති සහෙතුක කාමාවචර චිත්තං අට්ඨවිධම්පි හොති.

14 සොමනස්ස සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං,සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකං, උපෙක්ඛා සහගතං ඤාණවිප්පයුත්තං අසඞ්ඛාරිකමෙකං, සසඞ්ඛාරිකමෙකංති සහෙතුක කාමාවචර කිරිය චිත්තං අට්ඨවිධම්පි හොති.

15 ඉච්චෙවං කාමාවචර චිත්තං චතුවීස තිවිධම්පිහොති.

—0—

16 විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසල චිත්තං, විචාර පීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසල චිත්තං පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කුසල චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කුසල චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසල චිත්තං චෙති රූපාවචර කුසල චිත්තං පඤ්චවිධම්පි හොති.

17 විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන විපාක චිත්තං, විචාර පීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන විපාක චිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන විපාක චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන විපාක චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන විපාක චිත්තං චෙති රූපාවචර විපාක චිත්තං පඤ්චවිධම්පි හොති.

18 විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන කිරිය චිත්තං විචාර පීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන කිරියචිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන කිරිය චිත්තං, සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කිරිය චිත්තං, උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කිරිය චිත්තං චෙති රූපාවචර කිරිය චිත්තං පඤ්චවිධම්පි හොති.

19 ඉච්චෙවං රූපාවචර චිත්තං පන්නරස විධම්පි හොති.

---

20 ආකාසානඤ්චායතන කුසල චිත්තං, විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤා යතන කුසල චිත්තං චෙති අරූපාවචර කුසල චිත්තං චතුබ්බිධම්පි හොති.

21 ආකාසානඤ්චායතන විපාක චිත්තං, විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තං, ආකිඤ්චඤ්ඤායතන විපාක චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤා යතන විපාක චිත්තං චෙති අරූපාවචර විපාක චිත්තං චතුබ්බිධම්පි හොති.

22 ආකාසානඤ්චායතන කිරිය චිත්තං, විඤ්ඤාණඤ්චායතන කිරිය චිත්තං, ආකිඤ්චඤ්ඤායතන කිරිය චිත්තං, නෙවසඤ්ඤානාසඤ්ඤා යතන කිරිය චිත්තං චෙති අරූපාවචර කිරියචිත්තං චතුබ්බිධම්පි හොති.

23 ඉච්චෙවං අරූපාවචර චිත්තං ද්වාදසවිධම්පි හොති. තං පන පඤ්චමජ්ඣානෙ ගය්හති.

---

24 සොතාපත්ති මග්ගචිත්තං, සකදාගාමි මග්ග චිත්තං, අනාගාමි මග්ගචිත්තං, අරහත්ත මග්ගචිත්තං චෙති ලොකුත්තර කුසල චිත්තං චතුබ්බිධම්පි හොති.

25 සොතාපත්ති ඵල චිත්තං, සකදාගාමි ඵල චිත්තං, අනාගාමිඵල චිත්තං, අරහත්තඵල චිත්තං චෙති ලොකුත්තර විපාක චිත්තං චතුබ්බිධම්පි හොති.

26 ඉච්චෙවං ලොකුත්තර විපාකං අට්ඨවිධම්පි හොති.

——0——

27 එවං චිත්තං එකූන නවුති විධං හොති.

28 කථමෙකූන නවුති විධං චිත්තං එකවීසසතං හොති, විතක්කවිචාර පීතිසුඛෙකග්ගතා සහිතං පඨමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං, විචාර පීතිසුඛෙකග්ගතා සහිතං දුතියජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං, පීතිසුඛෙකග්ගතා සහිතං තතියජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං. සුඛෙකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං. උපෙක්ඛෙකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං චෙති සොතාපත්තිමග්ග චිත්තං පඤ්චවිධම්පි හොති.

29 තථා සකදාගාමිමග්ග අනාගාමිමග්ග අරහත්තමග්ග චිත්තං චෙති සමවීසතිමග්ග චිත්තානි. තථාඵල චිත්තානිචෙති. සමචත්තාලීසලොකුත්තර චිත්තානි භවන්තීති.

**ඉති පරමත්ථ සඞ්ඛෙපනිස්සං චිත්තසඞ්ඛෙපො පඨමො.**

——0——

1 එකුප්පාද නිරොධා ච, එකාලම්බන වත්ථුකා;
චෙතො යුත්තාපි පඤ්ඤාස, විධා චෙතසිකා සියුං.

2 සෙය්‍යථිදං? ඵස්සො වෙදනා සඤ්ඤා චෙතනා එකග්ගතා ජීවිතින්ද්‍රියං මනසිකාරො චෙති සබ්බචිත්ත සාධාරණ චෙතසිකං සත්තවිධං හොති.

3 විතක්කො විචාරො අධිමොක්ඛො විරියං පීතිච්ඡන්දො චාති පකිණ්ණක චෙතසිකං ඡබ්බිධං හොති.

4 ඉච්චෙවං අඤ්ඤසමාන චෙතසිකං තෙරස විධං හොති.

——0——

5 මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො දොසො ඉස්සාමච්ඡරියං කුක්කුච්චං ථීනමිද්ධං විචිකිච්ඡා චෙති අකුසල චෙතසිකං චුද්දසවිධං හොති.

---

6 සද්ධා සති හිරිඔත්තප්පං අලොභො අදොසො තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා කායපාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා චෙති සොභන සාධාරණ චෙතසිකං එකූනවීසති විධං හොති.

7 සමමාවාචා සමමා කම්මන්තො සමමා ආජීවො චෙති විරති චෙතසිකං තිවිධං හොති.

8 කරුණා මුදිතා චෙති අප්පමඤ්ඤා චෙතසිකං ද්විධං හොති.

9 ඉච්චෙවං සබ්බථාපි පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං සොභණ චෙතසිකං පචවීසති විධං හොති.

10 එවං චෙතසිකා එපඤ්ඤාසවිධා හොන්ති.

---

11 තත්ථ සබ්බ චිත්ත සාධාරණ චෙතසිකා තාව සබ්බෙසුපි එකූන නවුති චිත්තෙසු ජායන්ති.

12 පකිණ්ණකෙසු පන විතක්කො තාව ද්විපචවිඤ්ඤාණ වජ්ජිත කාමාවචර චිත්තෙසු චෙව එකාදසසු පඨමජ්ඣාන චිත්තෙසු චෙති පචපඤ්ඤාස චිත්තෙසු ජායති.

13 විචාරො පන සවිතක්ක චිත්තෙසු චෙව එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසු චෙති ඡසට්ඨි චිත්තෙසු ජායති.

14 අධිමොක්ඛො ද්විපච විඤ්ඤාණ විචිකිච්ඡා සහගත වජ්ජිතෙසු අට්ඨ සත්තති චිත්තෙසු ජායති.

15 විරියං පචද්වාර වජ්ජන ද්විපච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වජ්ජිතෙසු තිසත්තති චිත්තෙසු ජායති.

16 පීතිදොමනස්සුපෙක්ඛා සහගත කායවිඤ්ඤාණ චතුත්ථජ්ඣාන වජ්ජිතෙසු එකපඤ්ඤාස චිත්තෙසු ජායති.

17 ඡන්දො අහෙතුක මොහමූල වජ්ජිතෙසු එකූන සත්තති චිත්තෙසු ජායති.

---

18 අකුසලෙසු පන මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං චාති සබ්බාකුසල සාධාරණ චෙතසිකං චතුබ්බිධං හොති. තං පන සබ්බෙසුපි ද්වාදසා කුසලෙසු ජායති.

19 ලොභො අට්ඨසු ලොභසහගත චිත්තෙසු ජායති.

20 දිට්ඨි චතූසු දිට්ඨිගත සම්පයුත්තෙසු ජායති.

21 මානො චතූසු දිට්ඨිගත විප්පයුත්තෙසු ජායති.

22 දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං චෙති ද්වීසු පටිඝ සම්පයුත්ත චිත්තෙසු ජායන්ති.

23 ථිනමිද්ධං පඤ්චසු සසඞ්ඛාරික චිත්තෙසු ජායති.

24 විචිකිච්ඡා විචිකිච්ඡා සහගත චිත්තෙසු ජායති.

---

25 සොභනෙසු පන සොභණ සාධාරණ චෙතසිකා සබ්බෙසුපි එකූන සට්ඨි සොභණ චිත්තෙසු ජායන්ති.

26 විරතියො ලොකුත්තර චිත්තෙසු නියතා එකතොව ජායන්ති. කාමාවචර කුසලෙසු පන කදාචි නානා.

27 අප්පමඤ්ඤායො ද්වාදසසු පඤ්චමජ්ඣාන වජ්ජිත මහග්ගත චිත්තෙසු චෙව කාමාවචර කුසලෙසු ච සහෙතුක කාමාවචර කිරිය චිත්තෙසු චාති අට්ඨවීසති චිත්තෙසු කදාචි නානා ජායන්ති.

28 පඤ්ඤා ද්වාදස ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසු චෙව සබ්බෙසුපි පඤ්චතිංස මහග්ගත ලොකුත්තර චිත්තෙසු චාති සත්තචත්තාලීස චිත්තෙසු ජායති.

**ඉති පරමත්ථ පකාසනියං චෙතසික පකාසො දුතියො.**

---

1 රූපං සරූපවසෙන අට්ඨවීසති විධං හොති.

2 සෙය්‍යථිදං? පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු භූත රූපං නාම.

3 චක්ඛු සොතං ඝානං ජිව්හා කායො පසාද රූපං නාම.

4 රූපං සද්දො ගන්ධො රසො ආපොධාතු වජ්ජිතං භූතත්තය සඞ්ඛාතං ඵොට්ඨබ්බං ගොචර රූපං නාම.

5 ඉත්ථත්තං පුරිසත්තං භාවරූපං නාම.

6 හදයවත්ථු හදය රූපං නාම.

7 ජීවිතින්ද්‍රියං ජීවිත රූපං නාම.

8 කබළීකාරො ආහාරො ආහාර රූපං නාම.

9 ආකාසධාතු පරිච්ඡෙද රූපං නාම.

10 කායවිඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති විඤ්ඤත්ති රූපං නාම.

11 රූපස්ස ලහුතා මුදුතා කම්මඤ්ඤතා විඤ්ඤත්ති ද්වයං විකාර රූපං නාම.

12 රූපස්ස උපචයො සන්තති ජරතා අනිච්චතා ලක්ඛණ රූපං නාම.

13 එවං රූපං අට්ඨවීසතිවිධං හොති.

---

14 රූපසමුට්ඨානං පන කම්මං චිත්තං උතු ආහාරෙ චෙති චතුබ්බිධං හොති.

15 පඤ්චපසාද රූපානි ච ද්වෙ භාවරූපානි ච ජීවිත රූපං චෙති අට්ඨ ඉන්ද්‍රිය රූපානි චෙව වත්ථුරූපං ච කම්මජානෙව.

16 විඤ්ඤත්ති ද්වයං චිත්තජමෙව.

17 සද්දො චිත්තො තුජො.

18 ලහුතාදිත්තයං උතු චිත්තාහාරෙහි සම්භොති.

19 වණ්ණො ගන්ධො රසො ඔජා භූත චතුක්කං චෙති අට්ඨා විනිබ්භොග රූපානිචෙව ආකාසධාතු ච චතූහි සම්භූතානි.

20 ලක්ඛණ රූපානි න කුතොචි ජායන්ති.

**ඉති පරමත්ථ පකාසනියං රූපපකාසො තතියො.**

---

1 නිබ්බානං සභාවතො එකවිධම්පි ස උපාදිසෙස නිබ්බාන ධාතු අනුපාදිසෙස නිබ්බාන ධාතු චෙති දුවිධං හොති කාරණ පරියායෙන තථා සුඤ්ඤතං අනිමිත්තං අප්පණිහිතං චෙති තිවිධං හොති ආකාරභෙදෙන.

2 නිබ්බානං මනොවිඤ්ඤෙය්‍යං. විසුද්ධෙන මානසෙන පණීතෙන උජුකෙන අනාවරණෙන නිරාමිසෙන සම්මා පටිපන්නො අරියසාවකො නිබ්බානං පස්සති.

**ඉති පරමත්ථ පකාසනියං නිබ්බාන පකාසො චතුත්ථො.**

---

# පරමාර්ථ ප්‍රකාශනී සන්නය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

1 අහං, මම; පරමත්ථඤ්ඤුං, පරමාර්ථ ධර්මයන් දන්නාවූ; සම්බුද්ධංච, සම්බුද්ධයාද; සද්ධම්මං ච, ශ්‍රී සද්ධර්මයද; උත්තමං, උතුම්වූ; ගණංච, ආර්ය්‍ය සඞ්ඝ සමූහයාද; නත්වා, නමස්කාර කොට; පරමත්ථපකාසනිං, පරමාර්ථ ප්‍රකාශනී නම්වූ ප්‍රකරණය; සමාසෙන, සංක්‍ෂෙපයෙන්; වක්ඛං, කියමි.

2 චිත්තං ච, සිතද; චෙතසිකංච, චෛතසිකයද; රූපංච, රූපයද; නිබ්බානං ච, නිර්වාණයද; ඉති, මෙසේ; පරමත්ථා, පරමාර්ථ ධර්මයෝ; චතුබ්බිධා, සතර ආකාරයක් ඇත්තාහ. තත්ථ, ඒ චතුර්විධ පරමාර්ථ ධර්මයන් අතුරෙන්; චිත්තං, සිත; එකූනනවුතිවිධං හොති, එකූනනවු ප්‍රකාරවෙයි (අසූනව ආකාරවෙයි.)

3 ඉදං, මේ එකූනනවුප්‍රකාරය; සෙය්‍යථා, කවරේදයත්? සොමනස්ස සහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ; දිට්ඨිගත සම්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා සම්ප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග රහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග සහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සොමනස්ස සහගතං, සොම්නස් වෙදනාව හා එකොත්පාදාදි භාවයට ගියාවූ; දිට්ඨිගත විප්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා විප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග රහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග සහිතවූ; එකං චිත්තං, එක්සිතෙ; උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂා වෙදනාව හා එකොත්පාදාදිභාවයට ගියාවූ; දිට්ඨිගත සම්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා සම්ප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග රහිතවූ එකං චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග සහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂා වෙදනාව හා එකොත්පාදාදි භාවයට ගියාවූ; දිට්ඨිගත විප්පයුත්තං, මිථ්‍යාදෘෂ්ටිය හා විප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග රහිතවූ; එකං,චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, පූර්වප්‍රයොග සහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; ඉති, මෙසේ; ලොභමූලචිත්තං, ලොභමූලකවූ සිත; අට්ඨවිධම්පි හොති, අෂ්ටප්‍රකාර (අටආකාර) ද වෙයි.

4 දොමනස්ස සහගතං, දොම්නස් වෙදනාවහා එකොත්පාදදි භාවයට ගියාවූ; පටිඝසම්පයුත්තං, ද්වෙෂයහා සම්ප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, පූර්වප්‍රයොගරහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, පූර්වප්‍රයොගසහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; ඉති, මෙසේ; දොසමූලචිත්තං, ද්වෙෂමූලකවූසිත; දුවිධම්පි හොති, දෙයාකාරදවේ.

5 උපෙක්ඛාසහගතං, උපෙක්ෂා වෙදනාව හා එකොත්පාද දිභාවයට ගියාවූ; විචිකිච්ඡාසම්පයුත්තං, විචිකිත්සාව හා සම්ප්‍ර යුක්තවූ;එකං චිත්තං, එක්සිතෙක; උපෙක්ඛා සහගතං, උපෙක්ෂා සහගතවූ; උද්ධච්චසම්පයුත්තං, ඖද්ධත්‍යය හා සම්ප්‍රයුක්තවූ; එකං චිත්තං, එක්සිතෙක; ඉති, මෙසේ;මෝහමූලචිත්තං, මොහ මූලකවූ සිත; දුවිධම්පි හොති, දෙයාකාරද වෙයි.

6 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; අකුසලචිත්තං, අකු සලසිත; ද්වාදසවිධම්පි හොති, දොළොස් ආකාරදවෙයි.

## ද්වාදශඅකුශලචිත්තප්‍රකාශයයි.

---

7 උපෙක්ඛාසහගතං, උපෙක්ෂාසහගතවූ; චක්ඛුවිඤ්ඤා ණං ච, චක්ෂුර්විඥානයද; තථා, එසේම; (උපෙක්ෂා සහගතවූ) සොතවිඤ්ඤාණංච, ශොත්‍ර විඥානයද; ඝානවිඤ්ඤාණංච, ඝ්‍රාණවිඥා නයද; ජිව්හාවිඤ්ඤාණංච, ජිහ්වා විඥානයද; දුක්ඛසහගතං, දුක්ඛ වෙදනාව හා එකොත්පාදදි භාවයට ගියාවූ; කායවිඤ්ඤාණංච, කායවිඥානයද; උපෙක්ඛාසහගතං, උපෙක්ෂා සහගියාවූ; සම්පටි ච්ඡනචිත්තංච, සම්ප්‍රත්‍යෙෂණ චිත්තයද; උපෙක්ඛාසහගතං, උපෙක්ෂා සහගියාවූ; සන්තීරණ චිත්තංච, සන්තීරණ චිත්තයද; ඉති, මෙසේ; අකුසලවිපාක චිත්තං, අකුසලවිපාක චිත්තය; සත්තවිධම්පි හොති, සත්ආකාරදවෙයි.

8 උපෙක්ඛාසහගතං, උපෙක්ෂා සහගියාවූ; කුසලවිපාකං, කුශලවිපාකවූ;චක්ඛුවිඤ්ඤාණංච,චක්ෂුර්විඥානයද; තථා, එසේම; (උපෙක්ෂාසහගියාවූ;) සොතවිඤ්ඤාණංච, ශොත්‍රවිඥානයද; ඝාන විඤ්ඤාණංච, ඝ්‍රාණවිඥානයද; ජිව්හාවිඤ්ඤාණංච, ජිහ්වාවිඥාන යද; සුඛසහගතං,සුඛවෙදනාව හා එකොත්පාදදිභාවයට ගියාවූ කායවිඤ්ඤාණංච, කායවිඥානයද; උපෙක්ඛා සහගතං, උපෙක්ෂා සහගියාවූ; සම්පටිච්ඡන චිත්තං ච, සම්ප්‍රත්‍යෙෂණ චිත්තයද; සොමනස්සසහගතං, සොම්නස් සහගියාවූ; සන්තීරණචිත්තංච,

සන්තීරණචිත්තයද; උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂා සහගියාවූ; සන්තීරණචිත්තංච, සන්තීරණචිත්තයද; ඉති, මෙසේ; කුසල විපාකාහෙතුකචිත්තං, කුශලවිපාකඅහෙතුක චිත්තය; අට්ඨ විධම්පි හොති, අට ආකාරදවෙයි.

9 උපෙක්ඛාසහගතං, උපෙක්‍ෂාසහගියාවූ; පඤ්චද්වාරා වජ්ජනචිත්තංච, පඤ්චද්වාරාවර්ජනචිත්තයද; තථා, එසේම; (උපෙක්‍ෂාසහගියාවූ;) මනොද්වාරාවජ්ජනචිත්තංච, මනොද්වාරාවර්ජන චිත්තයද; සොමනස්සසහගතං, සොම්නස් සහගියාවූ; හසිතුප්පාදචිත්තංච, හසිතොත්පාදචිත්තයද; ඉති, මෙසේ;අහෙතුකකිරිය චිත්තං, අහෙතුක ක්‍රියාචිත්තය; තිවිධම්පි හොති, තුන්ආකාරද වෙයි.

10 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; අහෙතුකචිත්තං, අහෙතුක චිත්තය;අට්ඨාරස විධම්පි හොති, දහඅට ආකාරදවෙයි.

**අෂ්ටාදශ අහෙතුක චිත්තප්‍රකාශයයි.**

---

11 පාපාහෙතුකමුත්තානි, අකුශල හා අහෙතුකචිත්තයන් කෙරෙන් මුක්තවූ; එකූනසට්ඨිචිත්තානි, එකුන්සැටක් (පනස් නවයක්) පමණ චිත්තයෝ හෝ; අථ, නොහොත්;එකනවුතිපිවා එකානූ (අනූඑක්) චිත්තකෙනෙක් හෝ; සොභණානීති, ශොභනචිත්තයහයි; වුච්චරෙ, කියනු ලැබෙත්;

12 සොමනස්සසහගතං, සොම්නස්සහගියාවූ; ඤාණ සම්පයුත්තං, ඥානය හා සම්ප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, සංස්කාර රහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සසඞ්ඛාරිකං, සංස්කාරසහිතවූ; එකං චිත්තං, එක්සිතෙක; සොමනස්ස සහගතං, සොම්නස් සහගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා විප්‍රයුක්තවූ;අසඞ්ඛාරිකං, සංස්කාරරහිතවූ; එකං චිත්තං, එක් සිතෙක; සසඞ්ඛාරිකං, සංස් කාර සහිතවූ; එකං චිත්තං, එක් සිතෙක; උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂා සහගියාවූ; ඤාණසම්පයුත්තං, ඥානය හා සම්ප්‍රයුක්තවූ; අසඞ්ඛාරකං, සංස්කාර රහිතවූ; එකං චිත්තං, එක් සිතෙක; සසඞ්ඛාරිකං, සංස්කාර සහිතවූ;එකං චිත්තං,එක් සිතෙක; උපෙක්ඛා සහගතං, උපෙක්‍ෂා සහගියාවූ; ඤාණවිප්පයුත්තං, ඥානය හා විප්‍රයුක්තවූ; අසඞ්ඛාරිකං, සංස්කාරරහිතවූ; එකං චිත්තං, එක් සිතෙක; සසඞ්ඛාරිකං, සංස්කාරසහිතවූ; එකං චිත්තං, එක් සිතෙක; ඉති, මෙසේ; කාමාවචර කුසල චිත්තං, කාමාවචරකුසල චිත්තය; අට්ඨවිධම්පි හොති, අෂ්ට ප්‍රකාරද වෙයි.

13 සොමනසස සහගතං, සොම්නස් සහගියාවූ;—පෙ—ඉති, මෙසේ; සහෙතුකකාමාවචරවිපාකචිත්තං, සහෙතුක කාමා වචර විපාක චිත්තය; අට්ඨවිධම්පි හොති,අෂ්ටප්‍රකාර (අටආකාර) දවෙයි.

14 සොමනසස සහගතං, සොම්නස් සහ ගියාවූ; —පෙ— ඉති, මෙසේ; සහෙතුකකාමාවචරකිරියචිත්තං, සහෙතුක කාමාවචරක්‍රියාචිත්තය; අට්ඨවිධම්පි හොති, අෂ්ටප්‍රකාර (අට ආකාර)ද වෙයි.

15 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; කාමාවචර චිත්තං, කාමාවචරචිත්තය; චතුවීසතිවිධම්පි හොති, සූවිසි (විසිහතර) ආකාරදවෙයි.

**සූවිසි කාමාවචර චිත්තප්‍රකාශයයි.**

---

16 විතක්කවිචාරපීතිසුඛෙකග්ගතාසහිතං, විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන පඤ්චාඞ්ගික ධ්‍යානයෙන් යුක්තවූ; පඨමජ්ඣානකුසලචිත්තංච, ප්‍රථමධ්‍යානකුශලචිත්තයද; විචාරපීති සුඛෙකග්ගතා සහිතං, විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන චතුරඞ්ගි කධ්‍යානයෙන් යුක්තවූ; දුතියජ්ඣානකුසලචිත්තංච, ද්විතීයධ්‍යා නකුශල චිත්තයද; පීතිසුඛෙකග්ගතාසහිතං, ප්‍රීතිසුඛඑකාග්‍රතා යන ත්‍රි අඞගික ධ්‍යානයෙන් යුක්තවූ; තතියජ්ඣානකුසල චිත්තංච, තෘතීයධ්‍යාන කුශලචිත්තයද; සුඛෙකග්ගතාසහිතං, සුඛ එකාග්‍රතායන ද්විඅඞගික ධ්‍යානයෙන් යුක්තවූ; චතුත්ථජ්ඣාන කුසලචිත්තංච, චතුර්ථධ්‍යානකුශලචිත්තයද; උපෙක්ඛෙකග්ග තාසහිතං, උපෙක්ෂා එකාග්‍රතායන ද්විඅඞගික ධ්‍යානයෙන් යුක්තවූ; පඤ්චමජ්ඣානකුසලචිත්තංච, පඤ්චමධ්‍යාන කුශල චිත්තයද; ඉති, මෙසේ; රූපාවචර කුසල චිත්තං, රූපා වචර කුශල චිත්තය; පඤ්චවිධම්පි හොති, පඤ්චප්‍රකාර (පස් ආකාර) ද වෙයි.

17 විතක්කවිචාර පීතිසුඛෙ කග්ගතා සහිතං, විතර්කවිචාර ප්‍රීතිසුඛ එකාග්‍රතා යන පඤ්චාඞ්ගික ධ්‍යානයෙන් යුක්තවූ; පඨමජ්ඣාන විපාක චිත්තංච, ප්‍රථම ධ්‍යාන විපාක චිත්තයද; —පෙ— ඉති, මෙසේ; රූපාවචර විපාක චිත්තං, රූපාවචර විපාකචිත්තය, පඤ්චවිධම්පි හොති, පඤ්චප්‍රකාර (පස්ආකාර)ද වෙයි.

18 විතක්ක විචාර පීතිසුඛෙකග්ගතා සහිතං, විතර්ක විචාර ප්‍රීතිසුඛ ඒකාග්‍රතායන පඤ්චාඞ්ගික ධ්‍යානයෙන් යුක්තවූ; පඨමජ්ඣාන කිරිය චිත්තංච, ප්‍රථමධ්‍යාන ක්‍රියා චිත්තයද; —පෙ— ඉති, මෙසේ; රූපාවචර කිරිය චිත්තං, රූපාවචර ක්‍රියා චිත්තය; පඤ්චවිධම්පි හොති, පඤ්චප්‍රකාර (පස් ආකාරද)ද වෙයි.

19 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; රූපාවචර චිත්තං, රූපාවචර චිත්තය, පණ්ණරස විධම්පි හොති, පසලොස් ආකාරද වෙයි.

**පඤ්චදශ රූපාවචර චිත්ත ප්‍රකාශයයි.**

---

20 ආකාසානඤ්චායතනකුසලචිත්තංච, ආකාසානඤ්චායතනකුශලචිත්තයද; විඤ්ඤාණඤ්චායතනකුසලචිත්තංච, විඤ්ඤාණඤ්චායතනකුශලචිත්තයද; ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තංච, ආකිඤ්චඤ්ඤායතනකුශලචිත්තයද; නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චිත්තංච, නෛවසඤ්ඤා නාසඤ්ඤා යතන කුශල චිත්තයද; ඉති, මෙසේ; අරූපාවචර කුසල චිත්තං, අරූපාවචර කුශල චිත්තය; චතුබ්බිධම්පි හොති, සතර ආකාරදවෙයි.

21 ආකාසානඤ්චායතනවිපාකචිත්තං ච, ආකාසානඤ්චායතනවිපාකචිත්තයද; —පෙ— ඉති, මෙසේ; අරූපාවචර විපාක චිත්තං, අරූපාවචරවිපාකචිත්තය; චතුබ්බිධම්පි හොති, සතර ආකාරද වෙයි.

22 ආකාසානඤ්චායතනකිරියචිත්තං ච, ආකාසානඤ්චායතනක්‍රියාචිත්තයද; —පෙ— ඉති, මෙසේ; අරූපාවචර කිරිය චිත්තං, අරූපාවචරක්‍රියාචිත්තය; චතුබ්බිධම්පි හොති, සතර ආකාරද වෙයි.

23 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; අරූපාවචරචිත්තං, අරූපාවචර චිත්තය; ද්වාදසවිධම්පි හොති, දොලොස් ආකාරද වෙයි; තං පන, ඒ අරූපාවචර චිත්තය වනාහි; පඤ්චමජ්ඣානෙ, පඤ්චමධ්‍යානයෙහි; ගය්හති, ගනු ලැබේ.

**ද්වාදශ අරූපාවචර චිත්ත ප්‍රකාශයයි.**

---

24 සොතාපත්ති මග්ග චිත්තං ච, ශ්‍රොතාපත්තිමාර්ගචිත්තයද; සකදාගාමි මග්ග චිත්තං ච, සකෘදාගාමි මාර්ග චිත්තයද; අනා

ගාමිමගගචිත්තාං ච, අනාගාමි මාගී චිත්තයද; අරහත්තමගග චිත්තං ච, අර්හත්මාගී චිත්තයද; ඉති, මෙසේ; ලොකුත්තරකුසල චිත්තං, ලොකොත්තරකුශලචිත්තය; චතුබ්බිධම්පි හොති, සතර ආකාරද වෙයි.

සොතාපත්තිඵලචිත්තං ච, ශ්‍රොතාපත්ති ඵලචිත්තයද; සකෘදාගාමිඵලචිත්තං ච, සකෘදාගාමිඵල චිත්තයද; අනාගාමිඵල චිත්තං ච, අනාගාමිඵල චිත්තය; අරහත්තඵලචිත්තං ච, අර්හත් ඵල චිත්තයද; ඉති, මෙසේ; ලොකුත්තර විපාකචිත්තං,ලොකො ත්තරවිපාක චිත්තය; චතුබ්බිධම්පි හොති, සතර ආකාරද වෙයි.

26 ඉච්චෙවං, මේ යථොක්ත ක්‍රමයෙන්; ලොකුත්තරචිත්තං ලොකොත්තර චිත්තය;අට්ඨවිධම්පි හොති, අෂ්ටප්‍රකාර (අටආකා ර)ද වෙයි.

### අෂ්ටලොකොත්තරචිත්තප්‍රකාශයයි

---

27 එවං, මේ යථොක්ත ක්‍රමයෙන්; චිත්තං, චිත්තය; (සිත) එකූනනවුතිවිධංහොති, එකුනනවුප්‍රකාර (අසූනවආකාර) වෙයි.

28 එකූනනවුති විධං චිත්තං, එකූනනවු (අසූනව) ප්‍රකාර ඇති චිත්තය; කථං, කෙසේ; එකවීසසතං හොති, එක්සියඑක් විස්සෙක් (එකසියවිසිඑකක්) වේද; විතක්කවිචාරපීතිසුඛෙ කග්ගතාසහිතං, විතර්කවිචාර ප්‍රීතිසුඛ ඒකාග්‍රතායන පඤ්චා ඞ්ග ධ්‍යානයෙන් යුක්තවූ; පඨමජ්ඣාන සොතාපත්ති මග්ගචිත්තං ච, ප්‍රථමධ්‍යාන ශ්‍රොතාපත්තිමාගී චිත්තයද;—පෙ—ඉති, මෙසේ; සොතාපත්තිමගග චිත්තං, ශ්‍රොතාපත්තිමාගීචිත්තය; පඤ්ච විධම්පි හොති, පස්ආකාරද වෙයි.

29 තථා, එසේම; සකදාගාමිමගග අනාගාමි මගග අර හත්තමගග චිත්තං ච, සකෘදාගාමි මාගී සිත; අනාගාමි මාගීසිත; අර්හත්මාගී සිතද; පඤ්ච පඤ්ච විධම්පි හොති, පස් පස් ආකාරද වෙයි; ඉති, මෙසේ; සමවීසති මග්ගචිත්තානිච, සමවිසි මාගී චිත්තයෝද; තථා, එසේම; ඵලචිත්තානිච, සමවිසි ඵලචිත්ත යෝද; ඉති, මෙසේ; සමචත්තාලීසලොකුත්තරචිත්තානි, සම සතලිස් ලොකොත්තර චිත්තයෝ වෙති;

පරමත්‍ථපකාසනියං, පරමාර්‍ථප්‍රකාශනී නම්වූප්‍රකරණ යෙහි; පඨමො චිත්තපපකාසො, පළමුවෙනි චිත්තප්‍රකාශය; ඉති, මෙතෙකින් සමාප්තයි.

**චිත්ත ප්‍රකාශයයි.**

---

1 එකුප්පාදනිරොධාච, සිත හා සමග එකොත්පාද එක නිරොධවූද; එකාලම්බන වත්‍ථුකාච, එකාරම්මණ එකවස්තුකාවූද; චෙතො යුත්තා, යථොක්ත චතුර්විධ ලක්‍ෂණයෙන් චිත්තය හා සම්ප්‍රයුක්තවූ; චෙතසිකා, චෛතසිකධර්මයෝ; ද්විපඤ්ඤාසවිධා සියුං, දෙපනස් ප්‍රකාර වන්නාහ.

2 ඉදං, මේ දෙපනස් ප්‍රකාරය; සෙය්‍යථා, කවරේද යත්? ඵස්සොච, ස්පර්‍ශයද; වෙදනාච, වෙදනාවද; සඤ්ඤාච, සංඥාවද; චෙතනාච, චෙතනාවද; එකග්ගතාච, එකාග්‍රතාවද,ජීවිතින්ද්‍රියංච, ජීවිතේන්ද්‍රියද; මනසිකාරොච, මනසිකාරයද; ඉති, මෙසේ; සබ්බ චිත්ත සාධාරණ චෙතසිකං, සර්වචිත්ත සාධාරණ චෛතසිකය; සත්තවිධං හොති, සප්තවිධ (සත්ආකාර) වෙයි.

3 විතක්කොච, විතර්කයද; විචාරොච, විචාරයද; අධිමො ක්ඛොච, අධිමොක්‍ෂයද; විරියංච, වීර්‍ය්‍යයද; පීතිච, ප්‍රීතියද; ඡන්දොච, ඡන්දයද; ඉති, මෙසේ; පකිණ්ණකා චෙතසිකං, ප්‍රකීර්ණක චෛතසිකය; ඡබ්බිධං හොති, සයආකාරවෙයි.

4 ඉති, මෙසේ; අඤ්ඤසමාන චෙතසිකං, අන්‍යසමාන චෙ තසිකය; තෙරසවිධං හොති, තෙළෙස් ප්‍රකාර (දහතුන් ආකාර) වෙයි;

5 මොහොච, මොහයද; අහිරිකංච, අහිරිකයද; අනො ත්තප්පංච, අනොත්තප්පයද; උද්ධච්චංච, ඖද්ධත්‍යයද; ලොභොච, ලොභයද; දිට්ඨිච, මිථ්‍යාදෘෂ්ටියද; මානොච, මාන්නයද; දොසොච, ද්වෙෂයද; ඉස්සාච, ඊර්‍ෂ්‍යාවද; මච්ඡරියංච, මාත්සර්‍ය්‍ය යද; කුක්කුච්චංච, කෞකෘත්‍යයද; ථීනංච, ස්ත්‍යමානයද; මිඞංච මිඞයද; විචිකිච්ඡාච, විචිකිත්සාවද; ඉති, මෙසේ; අකුසල චෙත සිකං, අකුශල චෛතසිකය; චුද්දසවිධම්පි හොති, තුදුස්ප්‍රකාර (දසසතර ආකාර)දවේ.

6 සද්ධාච, ශ්‍රද්ධාවද; සතිච, සිහියද; හිරිච, හිරියද; (ලජ්ජා වද) ඔත්තප්පංච, ඔත්තප්පයද; අලොභොච, අලොභයද; අදො

සොච, අද්වේෂයද; තත්‍රමජ්ඣත්තතාච, තත්‍රමධ්‍යස්ථතාවද; කාය පස්සද්ධිච, කායප්‍රශ්‍රබ්ධියද; චිත්තපස්සද්ධිච, චිත්තප්‍රශ්‍රබ්ධියද; කායලහුතාච, කායලඝුතාවද; චිත්තලහුතාච, චිත්තලඝුතාවද; කායමුදුතාච, කායමෘදුත්වයද; චිත්තමුදුතාච, චිත්තමෘදුත්වයද; කායකම්මඤ්ඤතාච, කාය කර්මණ්‍යතාවද; චිත්තකම්මඤ්ඤතාච, චිත්තකර්මණ්‍යතාවද; කාය පාගුඤ්ඤතාච, කාය ප්‍රාගුණ්‍යතාවද; චිත්තපාගුඤ්ඤතාච, චිත්ත ප්‍රාගුණ්‍යතාවද; කායුජ්ජුකතාච, කායයාගේ ඍජුත්වයද;චිත්තුජ්ජුකතාච, චිත්තයාගේ ඍජුත්වයද; ඉති, මෙසේ; සොභණසාධාරණචෙතසිකං, ශොභන සාධාරණ චෛතසිකය; එකූනවීසතිවිධං හොති, එකුන්විසි (දහනව) ආකාරවෙයි.

7 සම්මාවාචාච, සම්‍යක්වාචාවද; සම්මාකම්මන්තොච, සම්‍යක් කර්මාන්තයද; සම්මා ආජීවොච, සම්‍යක් ආජීවයද; ඉති, මෙසේ; විරති චෙතසිකං, විරති චෛතසිකය; තිවිධං හොති, තුන් ආකාර වෙයි.

8 කරුණාච, කරුණාවද; මුදිතාච, මුදිතාවද; ඉති, මෙසේ අප්පමඤ්ඤචෙතසිකං, අප්‍රමාණ්‍යචෛතසිකය; ද්විවිධං හොති, දෙයාකාරවෙයි.

9 ඉච්චෙවං, මෙසේ; සබ්බථාපි, සර්වප්‍රකාරයෙන්; පඤ්ඤින්ද්‍රියෙන සද්ධිං, ප්‍රඥෙන්ද්‍රිය හා සමග; සොභණචෙතසිකං, ශොභන චෛතසිකය; පඤ්චවීසතිවිධං හොති, පස්විසි ආකාරවෙයි.

10 එවං, මේ යථොක්ත ක්‍රමයෙන්; චෙතසිකා, චෛතසිකයෝ; ද්විපඤ්ඤාසවිධා හොන්ති, දෙපනස් ආකාරවෙත්.

11 තත්‍ථ, ඒ චෛතසිකයන් අතුරෙන්; සබ්බචිත්තසාධාරණ චේතසිකා තාව, සර්ව චිත්තසාධාරණචෛතසිකයෝ වනාහි; සබ්බෙසුපි එකූන නවුති චිත්තෙසු, සියලු එකූනනවු ( අසූනව) චිත්තයෙහි වනාහි; ජායන්ති, උපදිත්.

12 පකිණ්ණකෙසු පන, ප්‍රකීර්ණකයන් අතුරෙන් වනාහි; තාව, පළමුකොට; විතක්කො, විතර්කය තෙම; ද්විපඤ්චවිඤ්ඤාණ කාමාවචර චිත්තෙසුචෙව, දෙපස් විඥානයන් විසින් වර්ජිතවූ සුසාළිස් කාමාවචර චිත්තයෙහිද; එකාදසසු පඨමජ්ඣාන චිත්තෙසුච, එකොළොස් ප්‍රථමධ්‍යාන චිත්තයෙහිද; ඉති, මෙසේ; පඤ්චපඤ්ඤාස චිත්තෙසු, පස්පනස් චිත්තයෙහි; ජායති, උපදනේයි.

13 විචාරෙ පන, විචාරය වනාහි;සවිතක්ක චිත්තෙසු චෙව, සවිතක්වූ පස්පණස් චිත්තයෙහිද; එකාදසසු දුතියජ්ඣාන චිත්තෙසු චෙව, එකොළොස් ද්විතීයධ්‍යාන චිත්තයෙහිද, ඉති, මෙසේ; ඡසට්ඨි චිත්තෙසු, සසැට චිත්තයෙහි; ජායති, උපදනේසි.

14 අධිමොක්ඛො, අධිමොක්‍ෂය තෙමේ; විපඤ්ච විඤ්ඤාණ විචිකිච්ඡාසහගත වජ්ජිතෙසු, දෙපස් විඥානය හා විචිකිත්සා සම්ප්‍රයුක්තයන් විසින් වර්ජිතවූ; අට්ඨසත්තති චිත්තෙසු, අට සැත්තෑ චිත්තයෙහි; ජායති, උපදනේසි.

15 විරියං, වීය්‍ර්‍යතෙමේ; පඤ්චද්වාරාවජ්ජනවිපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡනසන්තීරණවජ්ජිතෙසු, පඤ්චද්වාරාවජ්ජන, පංචද්වාරා වර්ජනයන් විසින්ද, විපඤ්චවිඤ්ඤාණ, දෙපස්විඥානයන් විසින්ද සම්පටිච්ඡන, සම්ප්‍රත්‍යෙෂණයන් දෙදෙනා විසින්ද; සන්තීරණ, සන්තීරණයන් තුන්දෙනා විසින්ද; වජ්ජිතෙසු, වර්ජිතවූ; තිසත්තතිචිත්තෙසු, තෙසැත්තෑ (හැත්තෑතුන්) චිත්තයෙහි, ජායති, උපදනේසි.

16 පීති, ප්‍රීතිතොමෝ; දොමනස්සුපෙක්ඛාසහගතකාය විඤ්ඤාණ චතුත්ථජ්ඣාන වජ්ජිතෙසු, දොමනස්සු පෙක්ඛා සහගත, දෞර්මනස් සහගත චිත්තයන් දෙදෙනා හා උපෙක්‍ෂා සහගත චිත්තයන් පස්පණස් දෙන විසින්ද; කායවිඤ්ඤාණ, කායවිඥාන යන් දෙදෙනා විසින්ද; චතුත්ථජ්ඣාන වජ්ජිතෙසු, එකාදශ චතුර්ථ ධ්‍යානයන් විසින්ද වර්ජිතවූ; එකපඤ්ඤාස චිත්තෙසු, එක්පනස් චිත්තයෙහි; ජායති, උපදනීසි.

17 ඡන්දො, ඡන්දයතෙමේ; අහෙතුක මොහමූල වජ්ජිතෙසු, අටළොස් අහෙතුකයන් විසින්ද මොහමූල චිත්තයන් දෙදෙනා විසින්ද වර්ජිතවූ; එකූනසත්තති චිත්තෙසු, එකුන්සැත්තෑචිත්ත යෙහි, ජායති, උපදනේසි.

18 අකුසලෙසු පන, අකුශල චෛතසිකයන් අතුරෙහි වනාහි; මොහොච, මොහයද; අහිරිකංච, අහිරිකයද; අනොත්ත ප්පංච, අනොත්තප්පයද; උද්ධච්චංච, ඖද්ධත්‍යයද; ඉති, මෙසේ; සබ්බාකුසල සාධාරණ චෙතසිකං, සියලු අකුශල සාධාරණ චෛ තසිකය; චතුබ්බිධං හොති, සතරආකාරවෙයි; තං පන, ඒ අකු ශල සාධාරණ චෛතසිකය තෙම වනාහි; සබ්බෙසුපි ද්වාදසාකුස ලෙසු, සියලුම දොළොස් අකුශල චිත්තයෙහි ජායති, උපදනේසි.

19 ලොභො, ලොභයතෙමේ; අට්ඨසු ලොභසහගත චිත්තෙසු, ලොභසහගත චිත්තයන් අටදෙනා කෙරෙහි; ජායති; උපදනේයි.

20 දිට්ඨි, දෘෂ්ටිතොමෝ; චතුසු දිට්ඨිගතසම්පයුත්තෙසු, දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තවූ ලොභසහගත චිත්තයන් සතරදෙනා කෙරෙහි; ජායති, උපදනීයි.

21 මානො, මානයතෙමේ; චතුසු දිට්ඨිගතවිප්පයුත්තෙසු, දෘෂ්ටිය හා විප්‍රයුක්තවූ ලොභසහගත චිත්තයන් සතරදෙනා කෙරෙහි; ජායති, උපදනේයි.

22 දොසො ච, ද්වේෂයද; ඉස්සා ච, ඊර්ෂ්‍යාවද; මච්ඡරියං ච, මාත්සර්‍ය්‍යයද; කුක්කුච්චං ච, කුකුසද; ඉති, මෙසේ; ඉමෙ, මේ චෙතසිකායෝ; ද්විසු පටිඝසම්පයුත්ත චිත්තෙසු, ප්‍රතිඝසම්ප්‍රයුක්ත චිත්තයන් දෙදෙනා කෙරෙහි; ජායන්ති, උපදිත්.

23 ථිනමිද්ධං, ස්ත්‍යානය හා මිද්ධය; පඤ්චසු සසඞ්ඛාරික චිත්තෙසු, පඤ්චවිධවූ සසංස්කාරික චිත්තයෙහි; ජායති, උපදනේයි.

24 විචිකිච්ඡා, විචිකිත්සා තොමෝ; විචිකිච්ඡාසහගත චිත්තෙසු, විචිකිත්සා සහගත චිත්තයෙහි; ජායති, උපදනීයි.

25 සොභණෙසු පන, ශොභන චෛතසිකයන් කෙරෙහි වනාහි; සොභණ සාධාරණ චෙතසිකා, ශොභන සාධාරණ චෛතසිකයෝ; සබ්බෙසුපි එකූනසට්ඨි සොභණ චිත්තෙසු, සියලු එකුන්සැට ශොභන චිත්තයෙහිම; ජායන්ති, උපදිත්.

26 විරතියො, විරති චෛතසිකයෝ; ලොකුත්තර චිත්තෙසු, සියලු ලොකොත්තර චිත්තයෙහි; නියතා, නියතවූවාහු; එකතොව ජායන්ති, එක්වම උපදිත්; කාමාවචර කුසලෙසු පන, කාමාවචර කුශල චිත්තයන් කෙරෙහි වනාහි; කදාචි, කිසි කාලෙක්හි; නානා ජායන්ති, වෙන වෙන උපදිත්.

27 අප්පමඤ්ඤායො, අප්‍රමාන්‍යයෝ; ද්වාදසසු පඤ්චමජ්ඣාන වජ්ජිත මහග්ගත චිත්තෙසු චෙව, පඤ්චමධ්‍යානයන් විසින් වර්ජිතවූ දොළොස් මහද්ගත චිත්තයන් කෙරෙහිද; කාමාවචර කුසලෙසුච, කාමාවචර කුශලයෙහිද; සහෙතුක කාමාවචර කිරිය චිත්තෙසුච, සහෙතුක කාමාවචර ක්‍රියා චිත්තයෙහිද; ඉති, මෙසේ; අට්ඨවීසති චිත්තෙසු, අටවිසි චිත්තයෙහි; කදාචි, කිසි කාලෙක්හි; නානා ජායන්ති, වෙන වෙන උපදිත්.

28 පඤ්ඤා, ප්‍රඥව; ද්වාදස ඤාණසම්පයුත්ත කාමාවචර චිත්තෙසු චෙව, ද්වාදශප්‍රකාර ඥානසම්පයුක්ත කාමාවචරචිත්ත යෙහිද; සබ්බෙසුපි පඤ්චතිංසමහග්ගත ලොකුත්තරචිත්තෙසුච, සියලු පන්තිස් මහද්ගත ලොකොත්තර චිත්තයෙහිද; ඉති, මෙසේ; සත්තචත්තාලීසචිත්තෙසු, සත්සාලිස් චිත්තයෙහි; ජායති, උපදනීසි.

**පරමාර්ථ ප්‍රකාශනි නම් ප්‍රකරණයෙහි**
**දෙවන චෛතසික ප්‍රකාශය නිමි.**

---

1 රූපං, රූපය: සරූපවසෙන, සවභාව රූප වශයෙන්; අට්ඨවීසති විධංහොති, අටවිසිවැදෑරුම්වේ.

2 ඉදං, මේ අටවිසිආකාරය; සෙය්‍යථා, කවරේදයත්? පඨවිධාතු, පෘථිවිධාතුවද; ආපොධාතු, ආපොධාතුවද; තෙජෝ ධාතු, තෙජෝ ධාතුවද; වායොධාතු, වායුධාතුවද; භූතරූපංනාම, භූතරූප නම්වේ.

3 චක්ඛු, චක්ෂුඃ ප්‍රසාදයද; සොතං, ශ්‍රොත්‍ර ප්‍රසාදයද; ඝානං, ඝ්‍රාණ ප්‍රසාදයද; ජිව්හා, ජිහ්වාප්‍රසාදයද; කායො,කායප්‍රසාදයද; පසාදරූපංනාම, ප්‍රසාදරූප නම්වේ.

4 රූපං, වර්ණායතනයද, සද්දො, ශබ්දායතනයද; ගන්ධො, ගන්ධායතනයද; රසො, රසායතනයද; ආපොධාතු වජ්ජිතං, ආපොධාතු වර්ජිතවූ; භූතත්තයසඞ්ඛාතං, භූතත්‍රයයයි කියනලද; ඵොට්ඨබ්බං,ස්ප්‍රෂ්ටව්‍යයද;ගොචරරූපංනාම, ගොචරරූපනම්වේ.

5 ඉත්ථත්තං, ස්ත්‍රීභාවයද; පුරිසත්තං, පුරුෂභාවයද; භාවරූපං නාම, භාවරූප නම්වේ

6 හදයවත්ථු, හෘදය වස්තුව; හදයරූපං නාම, හෘදය රූප නම්වේ.

7 ජීවිතින්ද්‍රියං, ජීවිතෙන්ද්‍රියතෙමේ; ජීවිත රූපං නාම, ජීවිතරූප නම්වේ.

8 කබළීකාරො ආහාරො, කබලිකාර ආහාරය තෙමේ; ආහාරරූපං නාම, ආහාරරූප නම්වේ.

9 ආකාසධාතු, ආකාශධාතුතොමෝ; පරිච්ඡෙද රූපංනාම, පරිච්ඡෙද රූපනම්වේ.

10 කායවිඤ්ඤත්ති, කායවිඥප්තියද; වචීවිඤ්ඤත්ති; වාග්විඥප්තියද; විඤ්ඤත්තිරූපං නාම, විඥප්තිරූප නම්වේ.

11 රූපස්ස, රූපයාගේ; ලහුතා, ලඝුත්වයද; මුදුතා, මෘදුත්වයද; කම්මඤ්ඤතා, කර්මණ්‍යතාවද; විඤ්ඤත්තිද්වයං, කායවාග්විඥප්තිද්වය; විකාරරූපං නාම, විකාරරූප නම්වේ.

12 රූපස්ස, රූපයාගේ; උපචයො, උපචයද; සන්තති, සන්තතියද; ජරතා, ජරතාවද; අනිච්චතා, අනිත්‍යත්වයද; ලක්ඛණරූපං නාම; ලක්ෂණ රූපනම්වේ.

13 එවං, මෙසේ; රූපං, රූපය; අට්ඨවීසති විධං හොති, අටවිසි ආකාරවෙයි.

14 රූපසමුට්ඨානං පන, රූපසමුට්ඨානය වනාහි; කම්මංච, කර්මයද; චිත්තංච, සිතද; උතුච, සෘතුවද; ආහාරොච; ආහාරයද; ඉති, මෙසේ; චතුබ්බිධං හොති, සතර ආකාරවේ.

15 පඤ්චපසාද රූපානිච, පස්ප්‍රසාද රූපයෝද; ද්වෙභාව රූපානිච, ද්විප්‍රකාර භාවරූපයෝද; ජීවිතරූපංච, ජීවිතරූපයද; ඉති, මෙසේ; අට්ඨඉන්ද්‍රිය රූපානිචෙව, අෂ්ට ඉන්ද්‍රියරූපයෝද; වත්ථුරූපංච, වස්තුරූපයද; කම්මජානෙව, කර්මයෙන්ම උපදනා හෙයින් කර්මජයෝමැයි.

16 විඤ්ඤත්තිද්වයං, කායවාග් විඥප්තිදෙක; චිත්තජමෙව, චිත්තජවායු පෘථිවීන්ගේ විකාරයක් හෙයින් චිත්තජ මැයි.

17 සද්දො, ශබ්දයතෙමේ; චිත්තොතුජො, චිත්තයෙන්ද සෘතුයෙන්ද ජාතහෙයින් චිත්ත සෘතුජයි.

18 ලහුතාදිත්තයං, ලඝුමෘදු කර්මක්ෂම රූපයන්ගේ විකාරවූ ලඝුතාදිත්‍රය; උතුචිත්තාහාරෙහි, සත්ප්‍රාය සෘතුය ප්‍රසන්නචිත්තය සත්ප්‍රාය ආහාරය යන මෙයින්; සම්භොති, වන්නේයි.

19 වණ්ණො, වර්ණයද; ගන්ධො, ගන්ධයද; රසො, රසයද; ඔජා, ඕජාවද; භූතචතුක්කංච, භූතචතුෂ්කයද; ඉති, මෙසේ; අට්ඨාවිනිබ්භොගරූපානිචෙව, අෂ්ටප්‍රකාරවූ විනිර්භොග රූපයෝද; ආකාසධාතුච, පරිච්ඡේද රූපයද; චතූහි සම්භූතානි, කර්මාදිචතුර්විධ ප්‍රත්‍යයෙන් වෙත්.

20 ලක්ඛණරූපානි, ලක්ෂණ රූපයෝ; කුතොචිපි, කිසි ප්‍රත්‍යයකිනුදු; නජායන්ති, නූපදනාහුයි.

## පරමාර්ථ ප්‍රකාශනී නම් ප්‍රකරණයෙහි තුන්වන රූපප්‍රකාශය නිමි.

---

1 නිබ්බානං, නිර්වාණය; සභාවතො, ස්වකීය ශාන්තලක්ෂණයෙන්; එකවිධම්පි, එකවිධවූයේ; කාරණා පරියායෙන, කාරණා ව්‍යවහාරයෙන්; සඋපාදිසෙස නිබ්බානධාතු, සොපාදිශෙෂ නිර්වාණ ධාතුවද; අනුපාදිසෙස නිබ්බානධාතුච, අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවද; ඉති, මෙසේ; දුවිධං හොති, ද්විප්‍රකාරවේ. තථා එසේම; ආකාර භෙදෙන, ආකාරභෙදයෙන්; සුඤ්ඤතං, සූඤ්ඤතය; අනිමිත්තං, අනිමිත්තය; අප්පණිහිතං චෙති, අප්පණිහිතයයි; තිවිධං හොති, තුන්ප්‍රකාරවේ.

2 නිබ්බාණං, නිර්වාණය; මනොවිඤ්ඤෙය්‍ය, මනසින් දතයුතු; සම්මාපටිපන්නෙන, මනාකොට පිළිපන්නාවූ; අරියසාවකෙන, ආර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේ; විසුද්ධෙන, අතිශුද්ධවූ; පණීතෙන, ප්‍රණීතවූ; අනාවරණෙන, අවිද්‍යාවරණ විරහිතවූ; නිරාමිසෙන, තෘෂ්ණාමිස විරහිතවූ; මානසෙන, මනසින්; නිබ්බානං, අමෘත මහා නිර්වාණය; පස්සති, දක්නාසේක.

## පරමාර්ථ ප්‍රකාශනී නම් ප්‍රකරණයෙහි සතරවන නිර්වාණ ප්‍රකාශය නිමි.

---

# නිගමනය.

1 චිත්තං චෙතසිකං රූපං, නිබ්බානංච සුදෙසිතා
පරමත්ථාසරූපෙන, කතාමරමම භික්ඛුනා
මන්දසොතුන මත්ථාය, පස්සන්තු ධම්මමාමකා.

2 ඉමිනා පුඤ්ඤකම්මෙන, අඤ්ඤෙහිච අසඞ්ඛතං
සච්ඡිකරෙමි සීඝං හං, තාවාපත්වා භවාභවෙ
සංසරන්තො අහං පුඤ්ඤෙ, ඡෙකො ච පඤ්ඤවාභවෙ.

3 පිටකත්තය ධාරකො, (මොන්ඵොන්ක්‍යිං) ඉතිනාමකො
චතුබ්බසෙසා මරම්මිකො, සොගතානං ධජෙවිය.

4 එවං දුරසා සාලෙව, බෙදූනි පිටකානිච
ජිව්හාග්ගෙමම වත්තන්තු, පාකටොහොතු ගුල්හකො

5 ඛෙචන්දුව සදාලද්ධං, සෙලක්ඛරෙව තිට්ඨතු.
අවෙජ්ඣවචනොහොමි, පහුති භාසකාලතො.


6 නජානාමිති පුච්ඡන්තෙ, නචභාසෙය්‍ය යාචිතෙ
නත්ථීතිච දදුගිති, දුජ්ජනෙහි නසංවසෙ.

7 අනත්ථංචපරෙසංපි, නකරෙනව චින්තයෙ
මෙත්තායෙව පකාසෙය්‍යං, මම පහොන්තුතථාතෙ.

8 මාතාපිතු නිදූනාපි, නචරෙය්‍ය මධම්මිකං
පියවාචො භවෙවීරො, සුභපෙජ්ජාච අසංහිරො.

**පරමත්ථපකාසනිනාම පකරණං නිට්ඨිතං.**

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු